## කවි කොළය

### විකට නාටක

මහ කොටියාගෙ කුණු වූ පා යුවල කපා
එක් තැන්වෙලා පසුවෙයි මෙට්ටයක දපා
කළ පව් පලදෙමින් පත්වී දුකට අපා
මර ගී ගයයි ඌ දැන් මහ පොළව හපා

දිය වැඩියාව වැළඳී වැඩි වී සීනී
ඒවා එකතු කරගෙන ගණනින් ගෝනී
බංකර් වලට පටවනවලු මදි වානී
සිදුවී තිබේ වකුගඩු දෙකටම හානී

මේ වැනි විකට තොරතුරු තව හැඩ ගස්සා
ජනතාවගේ මොළ පොප්පට ඇත බස්සා
ශිවනේෂන්ගෙ අවමගුලෙදි උඩ උස්සා
පෙන්වී රටට කොටියා ගාතය පස්සා

අඩි හතළිහක් මහ ගැඹුරේ පොළව යට
ඉදිකළ භවන කොටියාගේ කකුල කොට
විස්තර ඇතිව ඇඳ දක්වා ඇතුළ පිට
තිබුණා! හිනා යනවා එය දකින විට

මෙතනයි උගේ ඇඳ-මෙතනයි වැසි කිළිය
මුරකාවල් සහිත දොරටුව කුරු බිලිය
ජෙනරේටරය, වා කවුළුව, හිරු එළිය
දක්වා තිබේ එය තිතටම පැහැ දිලිය

පඩිපෙළ, විදුලි සෝපානය යටට යන
ටී.වී. සහිත සාකච්ඡා කරන තැන
මේ හැම දෙයම රූ සටහන් වලට ගෙන
දක්වා තිබුණි අටුවාවල් මොටද වෙන

රිංගා කනින් රැකවල් කළ සියළු දෙනා
මහකොටි ගුහාවට ගොස් මෙය ඇඳපු කෙනා
ගෙනදුන් නමුත් පාඨක ලෝකයට හිනා
මෙය පිළිගනීවිද අං ඇති කෙනෙකු විනා

වෙත්දැයි කොතැන මෙකියන බංකරය කොටී
නොදනී රජය - හමුදාවද නොදැන සිටී
එනමුත් අඳී එහි ඇඳ පුටු තිබෙන සැටී
බලපල්ලා යකෝ මුන් පව කෙළින හැටී!



කොටියා සුනාමියෙ
රැල්ලට අසුව මළා
උගෙ ඩමියක්ය දැන්
ඇත්තේ ඉතුරු වෙලා
බේගල් පුවත් පළවෙයි
යන පොළව පලා
අපි මේ විකට නාටක
දෙස සිටිමු බලා

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## කර්තෘට ලියුම්

### මහකොමසාරිස් කායාීලයට තුති මල් මිටක් !

මගේ රැකියාවට අදාල ලියවිල්ලක් ලබාගනු සඳහා මේ මෑත දිනක ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කායාීලයට යන්නට මට අවස්ථාවක් එළඹිණ. එම කායාීලයට ඇතුල් වූ මොහොතේ එහි සිටි පිළිගැනීමේ නිලධාරිනිය ඉතා සුහදව මා පිළිගත් අතර මඳකට අසුන්ගන්නා ලෙස කියා අනතුරුව මගේ අවශ්‍යතාව විමසුවා ය. ඉන් පසු ඇය ප්‍රසන්න නම් පරිපාලන නිලධාරියා වෙත මා යොමු කළා ය.

ඒ මහතා සිය නමට සරිලන ඉතා ප්‍රසන්න, එමෙන් නිහතමානී කෙනෙකු බව මට වැටහිණ. ඔහු ඉතා ව්‍යක්ත ලෙස තම මව්බස කතා කිරීම මම ඉතා අගය කරමි. එම කායාීලයේ ගත කළ කෙටි කාලය තුළ මට දැනුණේ මා ශ්‍රීලංකාවට ගියා සෙයකි. එතරම් ගුණගරුක, නිහතමානී සේවක මණ්ඩලයක් එහි පැමිණෙන සේවා දායකයන්ට තම සේවය ලබාදීම වාසනාවකි. ඒ සියළු දෙනාම විදේශීය රටක සිංහළකම හා තම අනන්‍යතාව රැකගැනීම පිළිබඳව මගේ ගෞරවය ඔවුන්ට පුදකරමි.

මේ රටට පැමිණ සුළු කාලයක් තුළ තම බස, රට, දැය අමතක කරන අපේ සිංහළ බොහෝ දෙනෙකුට ලන්ඩන් මහ කොමසාරිස් කාර්ය මණ්ඩලය කදිම ආදර්ශයක් සපයන අතර විදේශයේ ජීවත් වන සියළුම ලාංකික පිරිස් එම ආදර්ශය තම ජීවිතවලට එක්කරගනු ඇතැයි මම විශ්වාස කරමි.

♦ සන්ධ්‍යානි සේනාරත්න මිය
Rohampton, London SW 15



## කකුල කපා ඇත/නැත

කොටි නායක ප්‍රභාකරන්ට දියවැඩියාව ඇති නිසා ඔහුගේ කකුලක් කපා දැමීමට යන බව විශ්වාස ලෙස ආරංචියයි ලංකාවේ පුවත්පත් වල පළ වුණා. සමහර පුවත් මාධ්‍ය වල පළවුණේ කකුල් දෙකම කපා ඇති බවයි. ලන්ඩනයේ කොටි සාමාජිකයො කියන්නෙ කකුල කැපීමේ කතාව ගැන තමන් දන්නෙ නෑ කියලා. කකුල කැපුවත් නැතත් ප්‍රභාකරන් කවදාවත් අල්ල ගන්න ලැබෙන්නෙ නෑ කියලා උන් කියන්නෙ. ටික දවසකට පෙර ලංකාවෙ තව පත්තරේක පළවුණා ප්‍රභාකරන් ඉන්න බංකරයේ සිතියම. මෙන්න මෙතනයි මැන් ඉන්නෙ කියලා. අපේ ත්‍රිවිධ හමුදාවවත් නොදන්න, ඒ වගේම බොහෝ කොටි පවා නොදන්න මේ සිතියම් පත්තරවලට ලැබුණෙ කොහොමද? මේවර කවි කොළයෙන් තලංගම ජයසිංහ කිවිඳුන් විස්තර කරන්නනෙ ලංකාවෙ පත්තර පාඨකයා රවට්ටන හැටි.

## සුද්දන්ට පමණක් සලකන ලංකාවක්

මේ ළඟදි ලංකාවට ගිය වෙලේ මම කොළඹ ගියා. ත්‍රීවීලර් එකක නැගලා අවට සිරි නරඹමින් යන අතරෙ ධර්මපාල මාවතට හරවපු ගමන් පාර අයිනේ ගොඩනැගිල්ලක බිත්තියෙ ගහල තියෙනව දැක්කා **Only for Foreigners** කියලා. මම රියැදුරාගෙන් ඇහුවා මොකක්ද ඒ බාර් එකක්ද කියලා. මිනිහ කිව්වා නෑ ඕක ක්ලබ් එකක්, ලාංකිකයන්ට ඇතුල්වෙන්න අවසර නෑ, විදේශිකයන්ට පමණයි, ඔය වගේ ක්ලබ් තව තුනක් කොළඹ තියනවා කියලා. ඊට පස්සෙ මිනිහා ඒවා පෙන්නන්න මාව එක්කගෙන ගියා. ඊළඟ ක්ලබ් එකේ ගහල තිබුණේ **Foreigners Only** කියලා.

මේ ක්ලබ්වල ඇතුල්වීමෙ දොරටුව ළඟ නිල ඇඳුම් ඇඳගත් ආරක්ෂක නිලධාරීන් කීප දෙනෙක් හිටගෙන හිටියා. ත්‍රීවීලර් යාළුවා මට ඒගැන විස්තරයක් කළා. " සර් ඔය දොරවල් ළඟ ඉන්න සිකියුරිටි කාරයො ඇතුල්වෙන්න දෙන්නෙ සුද්දන්ට විතරයි. සුද්දො නෙවෙයි නම් පාස්පෝට් බලලා තමයි ඇතුල්වෙන්න දෙන්නෙ. කොච්චර සල්ලි තිබුණත් ලෝකල් අයට, ඒක ලාංකිකයන්ට කිට්ටුවෙන්න වත් දෙන්නෙ නෑ."

මීට කලිනුත් මම පත්තරේක දැක්කා ගාල්ලෙ කොටුව ඇතුලෙ අවන්හලක් ගැන. ඒකත් මේ වගේම සුද්දන්ට විතරක් ඇරුණු එකක්. තමන්ගෙ රටේ පුරවැසියන්ට ඇතුල්වීම තහනම් කරලා තියෙන මේ වගේ තැන් තියනවයි කියන එක ඇත්තටම අදහන්න පුළුවන්ද?

මම ත්‍රීවීලර් හාදයට කිව්වා, " පුතා අපි යං අර පළවෙනියට දැක්ක ක්ලබ් එක පැත්තෙන් කිය ලා. ඒ පාරෙ ක්ලබ් එකට කිට්ටු කරලා, වාහනේ හෙමිහිට යන ගමන් මම කැමරාව අරගෙන පොටෝ එකක් ගැහුවා. කැමරා ලයිට් එක පත්තුවෙච්ච ගමන් සිකියුරිටිකාරයො සේරම හැරුණු ත්‍රීවීලර් එක පැත්තට. වාහනේ ඉස්සරහට අද්දන කොට දැක්කා සික්කො ටික ඇතුළට දුවනවා.

"අර කස්ටිය සේරම ඇතුළට දිව්වෙ ත්‍රස්තවාදීන් ඇවිත් ක්ලබ් එක පොටෝ ගහං ගියා කියලා වෙන්න ඇති " ත්‍රී වීලර් සගයා හිනාවෙවී කිව්වා.

මට මෙහෙම හිතුණා. මේ විදියට යනකොට ලංකාවෙ තව ඉස්සරහට කඩ සාප්පු අරිවි ඥදරුසටබැරි ධබකහ කියලා. පාරෙ බස් යයි කොන්දොස්තරලා කෑගගහ ලංකාවෙ අය නගින්න එපා මේක විදේශියන්ට විතරයි කියලා. ලෝකෙ කිසිම රටක මේ වගේ දෙයක් මම අහලා නැහැ. ගෙවන සල්ලි වලංගු නම් මෙතන තියෙන වෙනස මොකක්ද? හේතුව මට හිතාගන්න අමාරුයි. ලාංකිකයන් ඥදරුසටබැරි ධබකහ ක්ලබ් වලට වැද්දගන්න තරම් වැදගත්කමක් නැති නිසාද? එහෙ මත් නැත්නම් ලාංකිකයෙක් ඒවට ඇතුල්වුනොත් අර උරුලෑවා ගිය තැන වගේ ගඳගහවි කියලද? මේවා පවත්වාගෙන යන්න අනුමැතිය දීලා තියෙන අපේ රටේ බලවත් පන්තියට, ඒ බලයට එන්න ඡන්දෙ දුන්නෙ මේ පහත් පෙළට දාපු ලාංකිකයො නේද? නැතුව ඔය එක සුද්දෙක් ඇවිත් ඡන්දෙ දීලා තියෙනවද?

අරාබි රටවල සාප්පුවල ඉස්සෙල්ලම අරාබිකාරයින්ට සල කලා ඉවරවෙලයි විදේශකයන්ට, සංචාරකයන්ට සලකන්නෙ. ඒ ඇයි කියලා කිසි කෙනෙක් ප්‍රශන කරන්නෙ නැහැ. හේතුව, ඒ රටවල් තමන්ගෙ ජනතාව ඉහළින් පිළිගන්න නිසා. ලංකාවෙ ඒකෙ අනික් පැත්ත. සුදුහම දැක්ක ගමන් වැඳුම් පිදුම් කරනවා. දැන් මේ එංගලන්තෙත් වැඩිපුර සැලකිලි ලැබෙන්නෙ සුද්දන්ට කියලා සුළු ජාතිකයො මැසිවිලි දොඩනවා. ඒත් ලාංකික අපට මොකද වෙලා තියෙන්නෙ? පරම්පරා ගණනක් ඉපදිලා හැදිලා වැඩිලා හිටපු තමන්ගෙම රටේ ලාංකිකයාව පාච්චල් කරනවා. විදේශිකයන්ට වන්දනා මාන කරනවා.

සුද්දන්ගෙ පාලනයෙන් නිදහස ලැබිලා අවුරුදු හැටක් ගියා. ඒත් සුදුහමට තියන ගැතිකම, ඒ නිවට මානසිකත්වය තවම අපේ රටෙන් ගිහිල්ලා නැහැ. ලංකාවට ගියාම ඒක හොඳට පේනවා

♦ ජෝර්ජ් ප්‍රනාන්දුපුල්ලෙ
London E17



**ඉරිදා - SUN** ලංකාවෙ මේ කාලය දේශපාලකයන්ට ඉතාම නරකයි. මේ මාස ගණන අතුළත කී දෙනෙක් මැරුණද? ලෙඩදුක්, අතුරු ආන්තරා කොටිත්‍රස්තවාදය. අළුත්ම දුක්ඛදායක මරණය ජෙයරාජ්. මේ හැම මරණයක්ම වළක්වගන්න තිබුණු ඒවයි කියලා තලවකැලේ නැන්දම්මා කියනවා. මම දන්නෙ නැහැ ඒක කොච්චර දුරට හරිද කියලා. දැන් මරාගෙන මැරෙන කොටියො හැම අස්සක මුල්ලකම මදුරුවො ගාණට. නැන්දම්මා කියනදේ ඇත්තකුත් තියනවා. ප්‍රේමදාස ජනාධිපතිවරයා එදා මැයි දවසෙ සෙනග ඉන්න තැනකට ගිහිං කොඩි වැනුවෙ නැත්නම්, එහෙනම් තවමත් ජීවතුන් අතර. ඒක පාඩමකට තවම කිසි මන්ත්‍රීකෙනෙක්, ඇමති කෙනෙක් අරගෙන නැහැ. පාඩමට ගත්ත නම් දමු දිසානායක තවම ඉන්නවා. ජෙයරාජ් තවම ඉන්නවා.

**සඳුදා - MON** ගිය සුමානෙ අපි ඇෂ්පර්ඩ් වල කිංස්ලිගෙ පුතාගෙ උපන්දිනයට ගියා. අපේ මිනිස්සු බිව්වම තමයි දේශපාලනේ කතාකරන්නෙ. ආණ්ඩුවට බනිනවා. තව කස්ටියක් විපක්ෂෙට බනිනවා. බඩුමිල නැගලයි කියලා බනිනනවා. හැබැයි ඒ හුඟ දෙනෙක් අවුරුදු දහයකින් වත් ලංකාවට ගිහිං නැහැ. එක් කෙනෙක් බනිනවා ඇයි මේ අපේ ලංකාවෙ සිංහළ කාන්තාවො හමුදාවට බන්දගෙන යුද්දෙට යවන්නෙ කියලා. බැරිම තැන මම කිව්වා, පිරිමි රටෙන් පැනලා ගිහිං වෙන රටවල් වල ඉඳන් බිබී වාචාල දොඩව දොඩව ඉන්නවා, ඒකයි ලංකාවෙ ගෑනුන්ට යුද්දෙට යන්න වුණේ. එච්චරද? ගෑණු තමයි අරාබියට ගිහිං හම්බකරලා ගෙනැල්ලා දෙන්නෙත් කියලා. අර කයිවාරු සේරම නැවතුණා.

**කුජදා - TUE** දැන් ලංකාවෙ හැම දෙයක්ම කරන්නෙ සාස්තර කාරයො කියන විදියට. ආතර් මාමගෙ මස්සිනා කෙනෙක් ඔපරේෂන් එකකට කොළඹ ලොකු ගෙවන වාට්ටුවකට ඇතුල් කරලා. දවස් හතරට රුපියල් ලක්ෂ ගණනක් බිල. ඔපරේෂන්එක ඉවරවෙලා ටිකට් කැපුවම ලෙඩාගෙ නැන්දම්මා කියලා තියනවා සාස්තරේට කිව්-වයි කියලා ලබන මාසෙ වෙනකල් ගෙදර ගෙනියන්න එපයි, තද බල අපලෙයි, වාට්ටුවෙම තියන්නෙයි කියලා. වාට්ටුවෙන් කිව්වලු කැමති කාලයක් ලෙඩා තියාගන්නම් හැබැයි දවසකට අටදාහ ගණනෙ ගෙවන්න කියලා. මෙන්න ඒකකියපු ගමන් එවලෙම ලෙඩා ගෙදරගෙනැත්.

**බුදදා- WED** ගිය සුමානෙ දවසක් ලංකාවෙ ගෙවල්වල තියන හට්ටි වළං බිමගහලා පොඩිකරන්න කියලා යූඇන් පී පක්සෙ ලංකාවෙ ඉන්න සේරම ගෘහණියන්ට කියලා. මොකද බඩුමිල ඉහළ ගිය හන්ද ආණ්ඩුව පාච්චල් කරන්න. කැතරින් නැන්දලත් උපතින්ම යූ ඇන් පී. නැන්ද නිතරම ඇඳන් ඉන්නෙත් කොළපාට සාරියක්. මං ටෙලිපෝන් කරපු වෙලාවෙ ඇහුවා නැන්නද හට්ටි වළං පොළවෙ ගැහුවෙ නැද්ද කියලා. නැන්ද කියනවා අපේ ගෙදර දැන් හට්ටි නැහැ. තියෙන්නෙ සිංගප්පූරු-වෙන් ගෙනාපු වටින සෝස්පෑන් වගයක්. අපෝ ඒවා පොළවෙ ගහන්න පුළුවන්ද දුවේ කියලා.

**ගුරුදා - THU** සුනිල්ල තලවතුගොඩ අළුතින් හදපු ගේ බලා ගන්න නෑයො වෙන කෙනෙක් තියලා, එයාට ඒකට ලොකු මුදලකුත් ගෙවල, මාස දෙකකට ඒ ගොල්ල මෙහේ ආවා. ආපහු යන කොට මිදුලෙ මල් පැල එකක්වත් නැතිලු. ගෙයි පිහන් කෝප්ප සේරම බිඳලා. නෑය කිව්වලු ඒව බිමවැටුණම සිමෙන්ති පොළව හන්ද බිඳෙනව කියලා. බිත්තියෙ තිබුණු කණ්ණාඩිය බිඳුනෙ කොහොමද ඇහුවම, වඳුරෙක් පැනලයි කිව්වලු. ලිඳට දාපු අළුත්ම පණ්ට්ටුව නැතිලු. ඒක ලිඳට වැටෙන්න ඇතිය කිව්වලු. සුනිල් කියනවා හොඳ වෙලාවට අපි ආපහු ගියේ, නැත්නම් උළුවහු ටිකත් නැති වෙයි කියලා. ඔන්න නෑයො වෙලත් ගේ බැලූ හැටි.

**කිවිදා - FRI** මුළු යුරෝපා රටවලින්ම හොඳම නිදහස් රට එංගලන්තෙයි කියලා අපි පිළිගන්න ඕන. හැම රට කම, ඒවට ගියාම පොලීසියෙන් පුද්ගල හැඳිනුම් පත බලනවා. ලංකාවෙත් දැන් ඒක අවශ්‍යයයි. මේ වගේ ඉහින් කනින් ත්‍රස්තවාදියො ඉන්න කාලෙ, මේ රටෙත් දුම්රිය බස් පුපුරවපු යුගයෙ, ඒත් මේ රටේ තවම අයි ඩෙන්ටිටි කාඩ් නැහැ. ඒක ගේනවට විරුද්ධ වෙන්නෙත් සුද්දොමයි. ඒ මොන කරදර තිබුණත් ඒවා වෙන විදියට විසඳගන්නවා මිස හැඳිනුම්පත් ඕන නෑ කියලා මෙහේ පාර්ලිමේන්තුවෙ කතාවෙනවා මම අහලා තියනවා. ඒක මෝඩ කතාවක්ද කියලත් මට වෙලාවකට හිතෙනවා.

**ශනිදා- SAT** සිංහළ අවුරුද්ද තව දවස් දෙකකින්. සුවර්ණා නංගිලා ප්‍රංශෙ ඉඳලා අද ලංකාවට යනවා ළමයින්ට අවුරුදු පෙන්නන්න. සෝමතුංග බාප්පලා එනවා කිව්වලු කටුනායකට එක්කගෙන යන්න. අවුරුදු පහළොවකින් මම සිංහළ අවුරුද්දට ලංකාවෙ හිටියෙ නැහැ. උපන් රටට සංස්කෘතියට ආදරේ නැති හන්ද නොවෙයි. ඒ කාලෙ හිතුවෙ උපන් රටෙන් අහලක්වත් මම නම් හෙල්-ලෙන්නෙ නැහැ කියලා. හැම දේම වෙනස්වෙන හැටි.